# දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව
# ඒ.අයි. වික්‍රම ශ්‍රවණාගාරය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
# අම්පාර.
# 2020.09.15

දිස්ත්‍රික්කය :- අම්පාර

## 01. පිළිගැනීමේ කථාව :-

2020.09.15 දින පවත්වන ලද දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම ආරම්භ කරමින් අම්පාර දිස්ත්‍රික් ලේකම් ඩී.එම්.එල්. බණ්ඩාරනායක මහතා විසින් ප්‍රථමයෙන් නව සම සභාපති දෙපල වන ගරු දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ඩබ්.ඩී. වීරසිංහ මැතිතුමා හා ගරු නැගෙනහිර පළාත් ආණ්ඩුකාර අනුරාධා යහම්පත් මැතිණියව ඉතා ගෞරවාදරයෙන් යුතුව පිළිගන්නා ලදි.

අනතුරුව කමිටුවට සහභාගී වී සිටි දිගාමඩුලු දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු වනජීවී රාජ්‍ය අමාත්‍ය විමලවීර දිසානායක මැතිතුමන් ගරු දිගාමඩුලු දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ෆයිසල් කාසිම් මැතිතුමන්, ගරු දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු නව මන්ත්‍රී වෛද්‍ය තිලක් රාජපක්ෂ මැතිතුමන් , දිගාමඩුලු දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු නව මන්ත්‍රී එස්.එම්.එම්.මුෂාරෆ් මැතිතුමන්, දිගාමඩුලු දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ටී.කලෛඅරසන් මැතිතුමන් හා මැති ඇමතිතුමන්ලාගේ සම්බන්ධීකරණ නිලධාරීන්, නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් තුසිත පී. වනිගසිංහ මැතිතුමන්, නැගෙනහිර පළාත් සභාවේ අමාත්‍යාංශ ලේකම්වරුන් සහ මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභාවල නගරාධිපතිතුමන්ලා හා සභාපතිතුමන්ලාද, ප්‍රාදේශීය ලේකම්වරුන්ද, පළාත් සභාවේ සියළු දෙපාර්තමේන්තු ප්‍රධානින්ද දිස්ත්‍රික්කයේ සියළු දෙපාර්තමේන්තු ප්‍රධානින්ද, නියෝජ්‍ය පොලිස්පති තුමන්,යුධ හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව, විශේෂ කාර්ය බලකාය නියෝජනය කරමින් පැමිණ සිටි ත්‍රිවිධ හමුදා නිලධාරීන්ද, සිවිල් ආරක්ෂක බලකායේ නිලධාරීන්ද, මාධ්‍යවේදීන්ද ඇතුළුව සහභාගී වී සිටි සියළු දෙනා ඉතා ගෞරවයෙන් යුතුව පිළිගන්නා ලදි.

02. අනතුරුව දිසාපතිතුමන් විසින් සභාවේ ඉදිරි කටයුතු සිදුකරගෙන යාමට නව සම සභාපතිවරුන්ට මූලාසනය භාර දෙන ලදි.

## 03. නව සම සභාපතිවරුන්ගේ කථාව.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සම සභාපති ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ඩබ්.ඩී. වීරසිංහ මැතිතුමා විසින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා සහභාගී වී සිටින ගරු වනජීවී රාජ්‍ය අමාත්‍ය විමලවීර මැතිතුමන්ට සුබ පැතුම් එක්කරමින් එතුමන් හා ගරු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සම සභාපති නැගෙනහිර පළාත් ආණ්ඩුකාර අනුරාධා යහම්පත් මැතිතුමිය ඇතුළු සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පළාත් පාලන ආයතන වල නගරාධිපතිතුමන්ලා හා සභාපති තුමන්ලා හා දිසාපතිතුමන් ඇතුළු සියළුම රජයේ නිළධාරීන්, එතුමන් විසින්ද පිළිගන්නා ලදි.

අනතුරුව තමන් අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති වශයෙන් පත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ට හා ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමන්ට එතුමන්ගේ විශේෂ ස්තූතිය ප්‍රකාශ කරන ලදි. පෙර පැවති ආකාරයටම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුළ සම්බන්ධීකරණ කාර්යාලයක් ස්ථාපිත කරමින් ඒ සඳහා අදාළ කාර්ය මණ්ඩලයක් බඳවා ගනිමින් කටයුතු කිරීමට පියවර ගන්නා බව මෙහි දී සභාපතිතුමන් විසින් අවධාරණය කරන ලදි. පළාත් සභාවේ හා මධ්‍යම රජයේ එකතුවෙන් දිස්ත්‍රික්කයේ සංවර්ධනය ඉහළ මට්ටමක පවත්වා ගැනීමට ගරු ආණ්ඩුකාරතුමියද සම සභාපති ධුරයේ සිටින බැවින්, අතිගරු ජනාධිපතිතුමන්ගේ දැක්ම වන **"සෞභාග්‍යයේ දැක්ම"** යන සංකල්පය සාක්ෂාත් කර ගැනීමට ඉතා පහසු බව වීරසිංහ ගරු සභාපතිතුමන් විසින් පෙන්වා දෙන ලදි. සියලුම ආයතන වල සහයෝගය කාර්යක්ෂමව හා ගුණාත්මකව ලබා දීමට කටයුතු සිදු කරන මෙන් ද ඉල්ලා සිටින ලද අතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම ඉතා ඵලදායී ලෙස පැවැත්වීමට සියලුම දෙනාගේ සහයෝගය අවශ්‍ය බව සඳහන් කරන ලදි.

ඉන් අනතුරුව ගරු සභාපතිතුමන් විසින් පෙන්වා දෙන ලද්දේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සාකච්ඡාවට බඳුන් කළ යුත්තේ ඉතා අත්‍යාවශ්‍ය කරුණු පමණක් බවත් හා විශේෂිත වූත් අවස්ථානුකූල වූත් දිස්ත්‍රික්කයට අදාළ ගැටළු පමණක් බවත් අවධාරණය කරන ලදි. එසේම, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කර විසඳුම් ලබාගත නොහැකි වූ ගැටළුද දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරිමට කටයුතු කරන මෙන් ද දන්වා සිටියේය. රාජකාරී බහුල රජයේ නිලධාරීන් මෙම කමිටුව නියෝජනය කරන බැවින් අවම වශයෙන් මෙම කමිටු රැස්වීම පැය 2 ½ ත් 3 ත් අතර කාලයකට සීමා කල යුතු බවත් එය චක්‍ර ලේඛයක් මගින් ද මේ බව අමාත්‍යාංශය මට්ටමින් දැනුවත් කර ඇති බවත් පෙන්වා දෙන ලදි.

සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් නොකර කමිටුවක් මගින් බොහෝ ගැටළුවලට විසඳුම් ලබා ගැනීමට කටයුතු කරන ලෙසට අතිගරු ජනාධිපති තුමන් විසින් ගරු සභාපති තුමන්ලාව දැනුවත් කර ඇති බව ගරු සභාපතිතුමන් සභාවට කරුණු ඉදිරිපත් කරන ලදි. එහිදී පහත සඳහන් අංශ 10 යටතේ රාජ්‍ය නිලධාරීන්ගෙන් යුත් කමිටු පත් කර කඩිනම් සේවාවක් ලබා දීමට කටයුතු කළ යුතු බව දන්වා පෙන්වා දුනි.

01. කෘෂි කාර්මික හා වැවිලි කර්මාන්ත ධීවර හා සත්ත්ව පාලන
02. ජල සම්පාදන, මාර්ග හා මහා මාර්ග, ටෙලිකොම් ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය හා ප්‍රවාහණය
03. වාරි මාර්ග හා ජල කළමනාකරණය
04. ආපදා කළමනාකරණය පරිසර කළමනාකරණය වන සම්පත් සුරැකීම වෙරළ සංරක්ෂණය
05. ඉඩම් හා ඉඩම් සංවර්ධනය
06. අධ්‍යාපන හා වෘත්තීය පුහුණුව, ආගමික කටයුතු කලා සාහිත්‍ය හා සංස්කෘතික
07. සෞඛ්‍ය
08. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා පලාත් පාලන ආයතනවල පහසුකම් වැඩිදියුණු කිරීම
09. ජීවනෝපාය සංවර්ධනය, කර්මාන්ත හා සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනය
10. ආරක්ෂක කටයුතු මානව සම්පත් හා සමාජ සංවර්ධනය, ක්‍රීඩා තරුණ කටයුතු හා රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරිත්වය

සම සභාපති ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී වීරසිංහ මැතිතුමන් විසින් ගරු සම සභාපතිණී නැගෙනහිර පළාත් ආණ්ඩුකාරතුමිය වන අනුරාධා යහම්පත් මැතිණියට සභාව ඇමතිමට අවස්ථාව ලබා දෙන ලදි. ගරු සභාපතිතුමිය විසින් සභාවෙන් අවසර ලබාගැනිමෙන් අනතුරුව පවසා සිටියේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවක පළමු නියෝජනයක් වන බැවින්, සභාවේ ඉදිරිපත් වන ගැටළු හා යෝජනා වලට තම දායකත්වය නොමදව ලබා දීමට කටයුතු කරන බව සඳහන් කරන ලදි. එමෙන්ම පළාත් සභාවට පැවරී ඇති විෂයන්ට අනුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන ගැටළු විසඳීමට අවශ්‍ය පියවර අදාළ නිලධාරීන් මගින් ගන්නා බවද ප්‍රකාශ කළාය.

ඉන් අනතුරුව දිස්ත්‍රික් ලේකම් තුමන් විසින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවක් පැවැත්විය යුතු ආකාරය හා එහි අන්තර්ගතය පිළිබඳව අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති මාර්ගෝපදේශයන් **(ඇමුණුම 01)** ගරු සභාවට ඉදිරිපත් කරන ලදි. එහි දී දිසාපතිතුමන් විසින් වැඩි දුරටත් පවසා සිටියේ පසුගිය දිනෙක පැවති දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සමුළුවට සංශෝධන කිහිපයක් උක්ත චක්‍රලේඛයේ අන්තර්ගතයට අමතරව ඉදිරිපත් කළ බවයි. **(ඇමුණුම 02)** එසේම, එම යෝජනා ගරු සභාවේ අනුමත වුවහොත් ඉතා කඩිනමින් අමාත්‍යාංශය වෙත දන්වා යවන බව සඳහන් කළ අතර එම යෝජනාව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ෆයිසල් කාසිම් මැතිතුමා විසින් සභා සම්මත කිරීමට යෝජනා කළ අතර අම්පාර නගර සභාවේ ගරු සභාපතිතුමා ස්ථිර කිරීම තුළින් සභා සම්මත විය. එයට අමතරව ගරු සභාපතිතුමා විසින් දිසාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධනයන් අතර ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව සඳහා පළාත් පාලන ආයතනවල නියෝජිතයින්ගේ සහභාගීත්වය සම්බන්ධයෙන් එය තමන් ඉතා අගය කරන බව සඳහන් කරන ලදි.

**04.** 2020.01.30 දින පැවැති අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ වාර්තාව ගරු රාජ්‍ය අමාත්‍ය විමලවීර දිසානායක මැතිතුමන් විසින් සභා සම්මතයට යෝජනා කරන ලද අතර මහඔය ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.** ගරු රාජ්‍ය අමාත්‍ය විමලවීර දිසානායක මැතිතුමා විසින් අම්පාර මහ රෝහලේ හිටපු අධ්‍යක්ෂ වෛද්‍ය ලංකාතිලක ජයසිංහ මහතා අම්පාර දිස්ත්‍රික්කය සඳහා කැප වුණු ආකාරය පිළිබඳව විශේෂ ඇගයීමකට ලක් කළ අතර එය ඉතා ගෞරවණීය සේවාවක් බව ද සඳහන් කරන ලදි. වෛද්‍ය ලංකාතිලක මහතාගේ අඩුව සම්පූර්ණ කල හැකි කිසිවෙකුත් නොමැති බව එතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි. එසේම අනුස්මරණ

ශාලාවක් හෝ රෝහල් වාට්ටුවක් වෛද්‍ය ලංකාතිලක ජයසිංහ මහතාගේ නමින් නම් කිරීමට කටයුතු කරන්නේ නම් එය ඉතා අගනා කෘතගුණ සැලකීමක් බව රාජ්‍ය ඇමතිතුමන් විසින් ගරු සභාවට දන්වා සිටින ලදි. ගරු සම සභාපතිනි නැගෙනහිර පළාත් ආණ්ඩුකාර අනුරාධා යහම්පත් මැතිණියද එය සුදුසු යෝජනාවක් බව පෙන්වා දෙන ලදි. එම යෝජනාව සෞඛ්‍ය අමාත්‍යාංශය දැනුවත් කර අදාළ ක්‍රියාමාර්ග ගැනීමට ගරු සභාවේ තීරණය විය. සම්මන්තුර ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති තුමන් විසින් වෛද්‍ය ලංකාතිලක ජයසිංහ මැතිතුමා පිළිබඳව දමිළ බසින් ඇගයීමක් සිදුකළ අතර 2004 සුනාමි ව්‍යසන අවස්ථාවේ ජාති ආගම් භේදයකින් තොරව ක්‍රියාකළ ආකාරය පිළිබඳවද සඳහන් කරන ලදි.

අනතුරුව අම්පාර දිස්ත්‍රික් ලේකම්තුමන් විසින් ගිනිගත් පැනමා නැව සම්බන්ධයෙන් අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේ එම ගින්න මැඩ පැවැත්වීමට ශ්‍රී ලංකා නාවික හමුදාව, යුධ හමුදාව, ගුවන් හමුදාව හා ශ්‍රී ලංකා පොලීසිය මෙන්ම, වෙරළ සංරක්ෂණ අධිකාරිය, සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරිය ගත් උත්සාහය ජාත්‍යන්තර පැසසුමට ලක්විය යුතු කරුණක් බවයි. ලෝක විනාශයක් සිදු වීමට ලක්වුණු අවස්ථාවක දිවි පරදුවට තබා තම යුතුකම ඉටුකළ සියළුම දෙනාට දිසාපතිතුමන්ගේ ගෞරව ප්‍රණාම ස්තුතිය පළ කරන ලද අතර පසුගිය වකවානුව තුළ රටේ ඇතිවුණු Covid-19 වසංගත අවස්ථාවේ සෞඛ්‍ය අංශය ඇතුළු අනෙකුත් සියළුම රාජ්‍ය නිලධාරීන් දැක්වූ සහයෝගය හේතුවෙන් අම්පාර දිස්ත්‍රික්කය එම වසංගතයෙන් බේරාගැනීමට හැකි වූ බවත් ඔවුන් සියළුම දෙනාටද දිස්ත්‍රික්කයේ සියළුම දෙනා වෙනුවෙන් දිසාපතිතුමන් විසින් ස්තුතිය පල කිරීමේ යෝජනාවක් සභාවට යොමු කරන ලදුව එය ඒකමතිකව සභා සම්මත විය.

06. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ආවරණ අනුමැතිය ලබා දුන් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය මගින් ඉදිරිපත් කළ ව්‍යාපෘති යෝජනා සඳහා කමිටුවේ අනුමැතිය ලබා දෙන ලදි. **(ඇමුණුම-03)**

07. **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පැවති ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රාදේශීය මට්ටමින් විසඳා නොමැති ගැටළු.**

මෙහිදී ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලට අදාළව ඉදිරිපත් වී තිබූ ගැටළු/යෝජනා එම කමිටුවලට යොමු කරන ලද බව දිස්ත්‍රික් ලේකම්තුමන් විසින් පෙන්වා දෙන ලදි.

| # | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | විෂය | වගකීම් දරණනිලධාරින්/ ආයතනය |
|---|---|---|---|
| 01 | ලාහුගල | 1.මීයංගොඩ වැව,ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම හා ඉඩම් ගැටළුව. මෙම වැව ප්‍රතිසංස්කරණය කිරීම තුළින් කුඹුරු අක්කර 400 ක් පමණ යල හා මහ දෙකන්න වගා කිරීමට හැකිවනු ඇත. එසේම, තවත් කුඩා වැව් 04 කට ජල සම්පාදනය කිරීමට හැකියාව ඇත. තවද, වසර කිහිපයකට පෙර කුඹුරු වගා කල අක්කර 26 ක භූමිය දැනට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් බැවින් එය නිදහස් කර දෙන ලෙස ඉල්ලීම.<br><br>වැව් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය ගරු සභාව විසින් අනුමත කරන ලද අතර දිසා වන නිලධාරි විසින් ද ඊට අදාළ අනුමැතිය ලබා දීමට කටයුතු කරන බව දන්වා වැව් සඳහා ඇස්තමේන්තු සකස් කර ඉදිරිපත් කරන ලෙස ගොවිජන සේවා සහකාර කොමසාරිස් තුමිය දැනුවත් කරන ලදි<br><br>වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දිසා වන නිලධාරි විසින් ප්‍රකාශ කරන ලද්දේ වන සංරක්ෂණ පනත යටතේ මෙම භූමියේ අධ්‍යාපන හා පර්යේෂණ කටයුතු සඳහා පමණක් යොදාගත හැකි බවත් හා වන සතුන් ගහන ප්‍රදේශයක් බැවින් වගා කටයුතු සිදු කළ නොහැකි බවත් ය. ගොවිජනසේවා සහකාර කොමසාරිස් තුමිය විසින් මෙම කුඹුරු ඉඩම් මීට ප්‍රථම වගා කර ඇති අතර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අවසරය නොමැති බැවින් දැනට ගොවින් වගා කටයුතු නොකරන බව ප්‍රකාශ කරන ලදි.<br>මේ සඳහා අදාළ කමිටු පත් කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට තීරණය විය. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව/ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| | | **II. ලාහුගල සිට පානම දක්වා විකල්ප මාර්ගයක් ඉදිකිරීම. යෝජිත මෙම මාර්ගය කි.මී. 16.5 පමණ දිගින් යුතු වේ. දැනට මෙහි කි.මී.9.1 සාමාන්‍ය මට්ටමින් ඉදිකිරීම් සිදු කොට ඇත. ඉතිරි කි.මී. 7.4 ඉදිකිරීමට ඇති අතර හැඩඔය හරහා පාලමක් ඉදිකර යුතුව ඇත.**<br><br>වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හා එම කාර්යයට අදාළ අනෙකුත් නිලධාරීන් සමග සාකච්ඡා කොට විසඳුමක් ලබා ගැනීමට තීරණය විය. | මාර්ග සංවර්ධන අධිකාරිය, මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව/වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 02 | නින්දවූර් | I.නින්දවූර් මුහුදු තීරයේ වෙරළ ඛාදනය වැලැක්වීමට පියවර ගැනීම<br><br>වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මේ පිළිබඳ සමීක්ෂණයක් සිදු කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසටත් ඊ ළඟ සභා වාරය සඳහා වරාය අධිකාරියේ හා අදාළ අනෙකුත් නිලධාරීන් කැඳවන ලෙස ගරු සභාපතිතුමිය විසින් දන්වා සිටින ලදි. | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පොතුවිල් |
| 03 | අම්පාර | **I.අම්පාර නගර සීමාව තුල ඇති වැව අවට භූමිය වන ජීවී දෙපාර්තමේන්තුව මගින් නිදහස් කිරීම පිළිබඳව ප්‍රගතිය පරීක්ෂා කිරීම**<br><br>කමිටුවක් පත් කර වියදීමට තීරණය විය. | වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 04 | ආලයඩිවෙම්බු | **ආලයඩිවෙම්බු දිසා රෝහලට අවශ්‍ය පානීය ජලය සැපයීම් ප්‍රමාණය වැඩි කිරීම.**<br><br>මේ සඳහා ඉල්ලීමක් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයෙන් ඉල්ලීමක් කරන ලෙස කල්මුණ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත දන්වන ලදි. | ආලයඩිවෙම්බු ප්‍රාදේශීය සභාව හා ජල සම්පාදන මණ්ඩලය |
| 05 | පොතුවිල් | **කොමාරි දිසා රෝහලට අවශ්‍ය පානීය ජලය සැපයීම් ප්‍රමාණය වැඩි කිරීම**<br>මේ සඳහා ඉල්ලීමක් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයෙන් ඉල්ලීමක් කරන ලෙස කල්මුණ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවාඅධ්‍යක්ෂ වෙත දන්වන ලදි | පොතුවිල් ප්‍රාදේශීය සභාව හා ජල සම්පාදන මණ්ඩලය |
| 06 | අඩ්ඩාලච්චේන | **දීඝවාපි රෝහලේ නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම හේතුවෙන් රෝහල ඉදිරිපිට පිහිටි තැපැල් කාර්යාලය වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීම**<br><br>මේ සඳහා සුදුසු ස්ථානයක් ලබා දීමට කටයුතු කරන ලෙසට දිස්ත්‍රික් ලේකම් හා අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා සිටින ලදි. | තැපැල් දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| 07 | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | අම්පාර දිස්ත්‍රික්කයේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් ණය හා ආධාර මගින් නිවාස ව්‍යාපෘති 2015 වර්ෂයේ සිට ආරම්භ කර ඇත. මෙයින් නිවසේ වැඩ 75% කොටසක් නිම කර ඇති බැවින් මේ වන විට බොහෝ දෙනෙක් පළමු වාරිකය පමණක් ලබාගෙන ඇත. වැඩි දෙනෙක් එයද ලබා ගෙන නොමැති බැවින් එම නිවාසලාභීන් නිවස නිමකිරීමට නොහැකිවීම හේතුවෙන් දැඩි අසීරුතාවයකට පත්ව ඇත<br><br>මෙම තොරතුරු ඇතුළත් සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති තුමන් විසින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ කළමනාකාරතුමියට දැනුම් දෙන ලදි. | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය |
| 08 | වෙනත් | **I.මහඔය ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති තුමන් විසින් පුලාවල සහ වරාබැද්ද යන ගම්වල කිසිදු මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියත්මක නොවීම හේතුවෙන් ජනතාව මහත් අසීරුතාවකට පත්ව ඇති බව.**<br><br>එළඹෙන 17 වන දින ජයිකා ආයතනය සමග සාකච්ඡාවක් පැවැත්වීමට නියමිත බැවින් එහිදී අයි රෝඩ් ව්‍යාපෘතිය යටතේ හා කි.මී. ලක්ෂයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පළාත් සභා හෝ මධ්‍යම රජයෙන් අනුමැතිය ලබා ගැනීමට තමන් කටයුතු කරන බව නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් තුසිත පී. වනිගසිංහ මහතා ප්‍රකාශ කරන ලදි.<br><br>**II. අයතා ලෙස සිදු වන වැලි ප්‍රවාහණය වහා නතර කිරීමට පියවර ගැනීම පිළිබඳව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ෆයිසාල් කාසිම් මැතිතුමා විසින් සඳහන් කිරීම**<br><br>දිස්ත්‍රික්කය පුරා සිදුවන මෙම අක්‍රමිකතා පිළිබඳ ඉතා කඩිනමින් තීරණයක් ගැනීම සඳහා සභාපති තුමන් විසින් මේ වන විටත් අතිගරු ජනාධිපතිතුමන් දැනුවත් කර ඇති බව සඳහන් කරන ලදි. එසේම, වෙනත් ප්‍රදේශවලින් පැමිණ වැව් සංවර්ධනය කරන බව පවසමින් සිදුකරන වැලි ජාවාරම් ඉතා කඩිනමින් නතර කළ යුතු බවත් මේ සම්බන්ධව වාරිමාර්ග දෙපාර්තමේන්තුව අදාළ පියවර ගැනීමට කටයුතු කළ බවත් සඳහන් කරන ලදි.<br><br>**III.අඩ්ඩාලච්චෙන ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති තුමන් විසින් වෙනත් ආයතන මගින් ක්‍රියාත්මක කරන මාර්ග සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව තමන් දැනුවත් නොකරන බවත් එම අතුරු මාර්ග ප්‍රාදේශිය සභා යටතේ නඩත්තු වන බැවින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර ප්‍රාදේශිය සභාව දැනුවත් කිරීම සිදු කළ යුතු බව ඉදිරිපත් කිරීම. හා අඩ්ඩාලච්චේන අෂ්රෆ් පාර (කසළ කළමනාකරණ මධ්‍යස්ථාන පාර), සුසාන භූමි පාර හා සංචාරක බංගලාව පාර යන පාරවල් ඉදිකිරීමට බොහෝ අවස්ථාවල අනුමත වුවත් ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් ක්‍රියාත්මක නොවූ බවත් කි.මී.** | පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය. |

| | | | |
|---|---|---|---|
| | | ලක්ෂයක් මාර්ග සංවර්ධනය කිරීමේ වැඩසටහනට ඇතුළත් කරන ලෙස ඉල්ලීම.<br><br>මින් ඉදිරියට සිදුකරන සියළුම ව්‍යාපෘති සම්බන්ධව අදාළ ආයතන දැනුවත් කර ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලෙස කමිටුව විසින් තිරණය කරන ලදි. එසේම, උක්ත මාර්ග 3 කි.මී. ලක්ෂයක් මාර්ග සංවර්ධනය කිරීමේ වැඩසටහනට ඇතුළත් කිරීම සභාවේ සම්මත විය. | ප්‍රාදේශීය සභාව අඩ්ඩාලච්චේන |
| | | **IV. මේ වන විට මත්ද්‍රව්‍ය භාවිතය ඉතා සීඝ්‍රයෙන් වෙරළබඩ ප්‍රදේශය පුරා ව්‍යාප්ත වන බවත්, මේ පිළිබඳව පොලීසිය දැනුවත් කළත් ඊට ක්‍රියාමාර්ග ගැනීමක් දැකිය නොහැකි බවත් ගරු පාරලිමේන්තු මන්ත්‍රී ෆයිසාල් කාසිම් මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කිරීම.**<br><br>එය එසේ නොවන බව අම්පාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සඳහන් කළ අතර මේ වන විට එම ක්‍රියාවේ නිරත වන පුද්ගලයන් හා කණ්ඩායම් විශාල වශයෙන් අත්අඩංගුවට ගෙන අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් සඳහන් කරන ලදි. මේ පිළබඳව තොරතුරු දන්නේ නම් තමන් වෙත පෞද්ගලිකව හෝ දැනුම් දෙන ලෙස වැඩිදුරටත් පොලිස් අධිකාරි තුමන් විසින් දන්වා සිටින ලදි. | ශ්‍රී ලංකා පොලීසිය අම්පාර. |
| | | **V. කරංගාව කුඹුරු ඉඩම් අයිතිය පිළිබඳ සම්මන්තුර ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති තුමන් විසින් විසඳුමක් ලබාදෙන ලෙසට ගරු සභාවට ඉදිරිපත් කරන ලදි.**<br><br>කමිටුවක් පත් කර විසඳීමට තීරණය විය. | |

**08.** **2020 වසර තුළ දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය ඉදිරිපත් කිරීම. අධ්‍යක්ෂ සැලසුම් කේ. පාක්‍යරාජා මහතා.**

2020 වර්ෂය සඳහා වැඩසටහන් 03 ක් යටතේ රු මිලියන 1080.07 ක් වටිනා ව්‍යාපෘති 1004 ක් අනුමත වූ අතර ඉන් රු මිලියන 350.00 ක් මේ වන විට වියදම් කර ඇත. **( ඇමුණුම 04 )**

## 09. ස්තුති කථාව

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ කටයුතු සාර්ථක කර ගැනීම වෙනුවෙන් කමිටුවට සහභාගී වී සිටි ගරු සම සභාපතිතුවරුන් දෙපළටත්, සියලුම පාර්ලිමේන්තු මැතිඇමතිවරුන්ටත් නගරාධිපතිවරුන්ටත් නගර සභා හා ප්‍රාදේශීය සභා සභාපතිවරුන්ටත්නැගෙහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් තුමා ඇතුළු අමාත්‍යාංශ ලේකම්වරුන්ට නියෝජ්‍ය පොලිස්පතිතුමා ප්‍රධාන පොලිස් නිලධාරීන්ට, ප්‍රාදේශිය ලේකම්වරුන්ට, ආරක්ෂක හමුදා නිලධාරීන්ට දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට,ආයතන ප්‍රධානීන්ට,හා මාධ්‍යවේදීන්ට අම්පාර දිස්ත්‍රික් ලේකම් ඩී.එම්.එල්.බණ්ඩාරනායක මහතා විසින් තම ස්තුතිය පළකර සිටීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ප.ව. 2.00 ට පමණ අවසන් විය

**ඩී.එම්.එල්.බණ්ඩාරනායක,**
**දිසාපති/ දිස්ත්‍රික් ලේකම්,**
**අම්පාර**

ඩී.එම්.එල්. බණ්ඩාරනායක
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
අම්පාර